සාර්ව ආර්ථික සමතුලිතය

සාර්ව ආර්ථික සමතුලිතය යනු - ආර්ථිකයේ සමස්ත නිමැවුමේ වටිනාකමට සමාන සමස්ත ඉල්ලුමක් හට ගැනීම සාර්ව ආර්ථික සමතුලිතය වේ.සමස්ත නිමැවුම ,සමස්ත ආදායම ලෙසද (y) , සමස්ත ඉල්ලුම , සමාහාර වියදම (E) ලෙසද හැඳින්වේ.ආර්ථික සමතුලිතයේදී සමස්ත නිමැවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය නොවී පවත්නා මට්ටමෙහි පවතී.

සාර්ව ආර්ථික අස්ථායීතාවය යනු - ආර්ථිකය තුළ සමස්ත ඉල්ලුම සපුරාලීමට සමස්ත සැපයුමට හැකියාවක් නොමැතිවීම සාර්ව ආර්ථික අස්ථායීතාව හෙවත් ආර්ථික අසමතුලිතය ලෙස හැඳින්වේ.මෙහිදී සමස්ත නිමැවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් නිතර උච්චාවචනය වේ.

සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි ප්‍රවේශ 3 කි.

1. සමාහාර ආදායම් = සමාහාර වියදම් ප්‍රවේශය

$$Y=E$$

$$E=C+I=G+(X-M)$$

එමනිසා $Y= C+I=G+(X-M)$

2.කාන්දුවීම් විදීම් ප්‍රවේශය-කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත ආර්ථිකයේ ආදායමේ වෘත්තාකාර ප්‍රවාහයෙන් පිටවීම් (කාන්දුවීම්) හා එකතුවීම් (විදීම්) සමානවීම යන කොන්දේසිය මත ආර්ථිකයක් සමතුලිත වේ. $W=J$

3.සමාහාර ඉල්ලුම් සමාහාර සැපයුම් ප්‍රවේශය -කිසියම් කාලපරිච්ඡේදයක් තුළ ආර්ථිකයේ සමාහාර ඉල්ලුම (AD) සමාහාර සැපයුමට (AS) ට සමානවීම යන කොන්දේසිය මත සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වේ.සමාහාර ඉල්ලුම සමන්විත වන්නේ පෞද්ගලික පරිභෝජනය (C),රාජ්‍ය පරිභෝජනය (G),ආයෝජනය (I) සහ ශුද්ධ අපනයන (Nx) යනාදියෙනි. **$AD = C+I+G+(X-M)$**

ප්‍රශ්න

1.සාර්ව ආර්ථික සමතුලිතය අර්ථ දක්වන්න.

2.සාර්ව ආර්ථික අසමතුලිතය යනු කුමක්ද?

3.සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි විකල්ප ප්‍රවේශ 3 පැහැදිලි කරන්න.